**ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය - 2020**

**-----------------------------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

**-------------------------------**

ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**---------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

**---------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනය අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනය මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

**--------------------------------------------------------------------**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ.

සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව  විගණනයේ කොටසක් ලෙස මා විසින්  විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන  ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- **මූල්‍ය ප්‍රකාශනවල** ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 හි 16 වන ඡේදය ප්‍රකාරව, ආයතනය සමාන ගනුදෙනු වෙනත් සිදුවීම් හා තත්ත්වයන් සඳහා එකම ප්‍රතිපත්තිය අනුගමනය කළ යුතු වුවද, ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ ප්‍රතිපත්තිය (සමාන වත්කම් සඳහා ක්ෂය අනුපාතය) හා කිලිනොච්චි පුහුණු මධ්‍යස්ථානයේ අනුගමනය කරනු ලබන ප්‍රතිපත්තිය එකිනෙකට වෙනස් බව නිරීක්ෂණය විය. | 2021 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී ආයතන දෙකටම අදාලව එකම ක්ෂය ප්‍රතිපත්තියක් අනුගමනය කර ඉදිරිපත් කිරීමට පියවර ගනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 92 ඡේදය ප්‍රකාරව, සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණද දැනටමත් භාවිතා කරනු ලබන පිරිවැය රු. 483,212,984 ක් වූ ස්ථාවර වත්කම් පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණු අතර ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව එම වත්කම්වල ඵලදායී ජීවිත කාලය පිළිබඳ වූ ඇස්තමේන්තුව නැවත සමාලෝචනය කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කර නොතිබුණි. | අදාල කාර්යය වර්තමානයේ ආරම්භකර ඇති අතර, 2021 අවසන් ගිණුම් ඉදිරිපත් කිරීමේදී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිතිය ප්‍රකාරව වත්කම්වල ඵලදායි ජීවකාලය සහ ධාරණ අගය සඳහන් කිරීමට පියවර ගන්නා බව දන්වා සිටිමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 69 වන ඡේදය ප්‍රකාරව, වත්කමක ක්ෂය කිරීම අරම්භ වන්නේ එය පාවිච්චි කිරීමට සූදානම් තත්වයට ගෙන ආ පසු වුවද කිලිනොච්චිය පුහුණු මධ්‍යස්ථානය වර්ෂය තුළ රු. 11,246,916 ක් වටිනා වත්කම් අත්පත් කරගෙන ඇතත් මධ්‍යස්ථානයේ වත්කම් ක්ෂය කිරීම මිලදී ගත් වර්ෂයට පසු වර්ෂයේ සිට සිදුකරන බව නිරීක්ෂණය විය. | 2021 වර්ෂයේ ගිණුම් ඉදිරිපත් කිරීමේදී මෙම දෝෂය නිවැරදි කර මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට පියවර ගන්නා බව දන්වා සිටිමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කළ යුතුය. |

1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ 2020 දෙසැම්බර් 31 දිනට රු. 3,603,442 ක් වූ ණයගැති ශේෂයක් වූ අතර ඒ තුළ වර්ෂ 10 කට වඩා පැරණි එකතුව රු. 1,111,415 ක් සහ වර්ෂ 5 ත් 10 ත් අතර ණයගැති ශේෂය රු. 2,109,449 ක් වූ අතර එම ණය අයකර ගැනීමට හෝ මුදල් රෙගුලාසි 113 ප්‍රකාරව අනුමැතිය ලබාගෙන පොත්වලින් කපාහැරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට ආයතනය විසින් කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු ණයගැතියන්ගෙන් විශාල ප්‍රමාණයක් ශ්‍රී.ලං.ග.ම. බස්රථ අළුත්වැඩියා කිරීම සම්බන්ධයෙන් අය විය යුතු මුදල් බව දන්වා සිටිමි. ඒ අනුව දෙපාර්ෂවය අතර හැකි ඉක්මනින් සාකච්ජා කර මෙම ශේෂය නිරවුල් කර ගැනිමට පියවර ගනු ලැබේ. | ණයගැති ශේෂ අයකර ගැනීමට හෝ මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති රීති රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2003 ජුනි 2 දිනැති පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය | මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, ආයතනය විසින් කිලිනොච්චි පුහුණු මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රකාශන ඒකාබද්ධ කර, මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ 2021 ඔක්තෝබර් 26 දිනය. | 2020.01.09 අමාත්‍ය මණ්ඩල තීරණය මත කිලිනොච්චි ශ්‍රී ලංකා ජර්මානු කාර්මික පුහුණු ආයතනයේ පරිපාලන මූල්‍ය කටයුතු හා අනෙකුත් සම්පත් ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය වෙත පැවරුණ ද ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ පනත සංශෝධනය වීමත් හෝ නව පනත මගින් ආයතන දෙක එක් ආයතනයක් ලෙස ස්ථාපනය නොකිරීමත් යන කරුණු පදනම්ව අදාළ ආයතන දෙකෙහි මූල්‍ය ප්‍රකාශන වෙනම ඉදිරිපත් කරන ලදී. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 1646 | වාර්තාව ඉදිරිපත් කරනු ලබන මාසයට පසු ඊළඟ මාසයේ 15 වන දිනට පෙර ඒ ඒ මාසයේ දෛනික ධාවන සටහන් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, ආයතනයේ පවතින වාහන 25 ට අදාලව ඒ අනුව කටයුතු කර නොතිබුණි. | දැනට එක දිගට වසර ගණනක් භාවිතා කල හැකි ලෙස සකස් කර ඇති පිටු 100කින් සමන්විත ධාවන සටහන් පොත් වල පිටපත් හෝ අවසන් වූ ධාවන සටහන් පොත් ලබා දිය හැකිය. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2018 ජූලි 17 දිනැති 2018 අංක 19 දරන ජාතික විගණන | ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වාර්ෂික සහ වෙනත් මූල්‍ය ප්‍රකාශන අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙළ | 2018 සහ 2019 වාර්ෂික වාර්තා හැකි ඉක්මනින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරිමට අවශ්‍ය කටයුතු සිදුකෙරෙමින් පවති. | පනතේ වගන්ති ප්‍රකාරව කටයුතු |

| | | |
|---|---|---|
| පනතේ අංක 38 (1) (ඇ) ඡේදය | කිරීම සිදු වන බවට සහතික විය යුතු අතර, ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්වයන්ට අදාල වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වග බලාගත යුතු වුවත්, 2018 හා 2019 වර්ෂවල වාර්ෂික වාර්තා මෙතෙක් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | කළ යුතුය. |

2. මූල්‍ය සමාලෝචනය
-----------------------
මූල්‍ය ප්‍රතිඵල
---------------

සමාලෝචිත වර්ෂයේ ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු. 22,943,923 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌණතාවය රු. 196,062 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය සියයට 11602 කින් හෙවත් රු. 22,747,861 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට වාර්ෂික ක්ෂය රු. 103,461,759 කින් වැඩිවීම හා ගිවිසුම්ගත සේවා වියදම රු. 10,192,243 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය
----------------------------
කළමනාකරණ අකාර්යක්ෂමතා
-----------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පුරප්පාඩු වී ඇති ප්‍රධාන තනතුරු පහට අදාළව අධ්‍යාපන සුදුසුකම් වලට සම වැටුප්තල සකස් කර ඒ පිළිබඳව භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර එම පුරප්පාඩු පිරවීමට කටයුතු කිරීමට හා ආයතනයේ සේවක තනතුරු ප්‍රති ව්‍යුහගත කිරීමේදී වැටුප් වර්ධක සම්බන්ධයෙන් ඇති වූ ගැටලු සහගත තත්ත්වයන් භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර නිවැරදි කර ගැනීමට 2019 මැයි 23 දින පැවැති පොදු ව්‍යාපාර පිළිබඳ ගිණුම් කාරක සභා රැස්වීමේදී ගෙන තිබූ එම තීරණයන් 2021 නොවැම්බර් 30 දින තෙක් ක්‍රියාත්මක කර නොතිබුණි. | ආයතනය සඳහා විශේෂ වැටුප් ක්‍රමයක් යෝජනා කරමින් 2020.03.05 දාතමින් රේඛීය අමාත්‍යාංශ ලේකම් මඟින්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සහ සභාපති ජාතික වැටුප් කොමිසමට ලිපියක් යොමු කර ඇතිමුත් ඊට ප්‍රතිචාරයක් ලැබී නොමැත. රේඛීය අමාත්‍යාංශය යටතේ ඇති කාර්මික පුහුණු ආයතන වල අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පවතින වැටුප් ගැටළු නිරාකරණය කිරීම සඳහා අමාත්‍යාංශයේ මූලිකත්වයෙන් පත් කරන ලද කමිටුව සහභාගී වී පවත්නා ගැටළු සම්බන්ධව දැනුවත් කර ඇත. | බඳවා ගැනීමේ පටිපාටියට අනුව පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු අතර, තනතුරු ප්‍රති ව්‍යුහගත කිරීමේදී ඇති වූ ගැටළුකාලී තත්ත්වයන් නිවැරදි කරගත යුතුය. |